දිනය
திகதி
Date. 2026.07.08

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**Human Rights Commission of Sri Lanka**

ආර්. ප්‍රසාද් හේමන්ත කුමාර මහතා,
වැ.බ. බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල්,
බන්ධනාගාර දෙපාර්තමේන්තුව,
බන්ධනාගාර මූලස්ථානය,
අංක 150, බේස්ලයින් පාර,
කොළඹ.

හිතවත් කොමසාරිස් ජෙනරාල්තුමනි,

**<u>මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියා සහ ඉන් පසුව අනෙකුත් බන්ධනාගාරවල සිදු වූ සිදුවීම් පිළිබඳ විමර්ශනය</u>**

2026 ජූලි 5-6 දිනවල මීගමුව බන්ධනාගාරයේ සිදු වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියා සහ 2026 ජූලි 7 වන දින බන්ධනාගාර කිහිපයකට මාරු කරන ලද රැඳවියන්ට එරෙහි සිදු වී ඇති ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් ඔබගේ අවධානය යොමු කරමු.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (HRCSL) 2026 ජූලි 5-6 දිනවල මීගමුව බන්ධනාගාරයේ පැන නැගුණු ප්‍රචණ්ඩ ක්‍රියා සහ තවත් බන්ධනාගාර කිහිපයක පසුව සිදු වූ සිදුවීම් සම්බන්ධයෙන් 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ බලතල ප්‍රකාරව විමර්ශනයක් ආරම්භ කර ඇත. මීගමුව බන්ධනාගාරයේ සිදු වූ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් රැඳවියන් 21 දෙනෙකු සහ බන්ධනාගාර නිලධාරීන් හය දෙනෙකු මිය ගොස් ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාවේ අවධානයට ගනී. මෙකී ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව විමර්ශනය කිරීම සඳහා විශේෂ විමර්ශන කණ්ඩායමක් පත් කර ඇති බව ද අපි දැනුවත්ව සිටිමු.

2020 දී ප්‍රකාශයට පත් කරන ලද 'බන්ධනාගාර අධ්‍යයනය' තුළ බන්ධනාගාර තුළ සිදුවන මරණ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේ නිරීක්ෂණ සිහිපත් කිරීමට කැමැත්තෙමු. පද්ධතිමය 'අඩුපාඩු' මෙන්ම 'සම්පත් සහ කාර්ය මණ්ඩලයේ දැඩි හිඟය' නිසා 'බන්ධනාගාර තුල සිරකරුවන්ට ඉතා අවධානම් සහිත පරිසරයක්' බවට පත්ව ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කළේය. බන්ධනාගාර තුල වධහිංසා පැමිණවීම් සහ වෙනත් ආකාරයේ අයහපත් සැලකිලිවලට ලක්වන රැඳවියන් සහ එවැනි උල්ලංඝනයන් සම්බන්ධව වගවීමක් නොමැතිකම සම්බන්ධයෙන් වූ සොයාගැනීම් ද මෙම අධ්‍යයනයට ඇතුළත් විය. 'බන්ධනාගාර තුළ සිදුවන මරණ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ක්‍රියා පටිපාටි සහ යාන්ත්‍රණයන්' සම්බන්ධයෙන් කරනු ලැබූ පහත නිර්දේශ මගින් එය සිහිපත් කරනු ලබයි.

1. සිරගත කිරීමට පෙර වධහිංසාවන්ට ලක්වීම පිළිබඳ පැමිණිලි කරන සිරකරුවන් පිළිබඳව සුපරීක්ෂාකාරීව සිටීම සහ ඔවුන් අධිකරණ වෛද්‍ය නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීම සහ අවශ්‍ය ප්‍රතිකාර ලබා දීම සහ එකී හිංසාවන්ට වගකිව යුත්තන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම, ඒ මගින් එවැනි ප්‍රචණ්ඩත්වයෙන් සිදුවන මරණ වළක්වා ගැනීම.

2. ප්‍රතිවාදී සිරකරුවන් අතර ඇතිවන හිංසනයන් අවම කිරීමෙන් සහ සිරකරුවන්ට කරන තර්ජන හේතුවෙන් වාට්ටු වෙනස් කිරීම සඳහා ඉල්ලා සිටියහොත් ඒ සඳහා පරික්ෂා කර අවසර දීමෙන් රැඳවියන් අතර ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පියවර ගැනීම හා එවැනි පැමිණිලි සම්බන්ධයෙන් කඩිනම් පියවර ගැනීම.



ප්‍රධාන කාර්යාලය / தலைமைக் காரியாலயம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04. / 14, R.A.De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94-11- 2505580/81/82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 1996
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

3. අපරාධ චක්‍රලේඛ 19/2014 (IG චක්‍රලේඛ 2508/2014) අනුව බන්ධනාගාරයට රහස්‍ය වාර්තාවක් මගින් ලබා දෙන සිරකරුගේ පසුබිම පිළිබඳ තොරතුරු පිළිපැදීමෙන් අනෙකුත් සංවිධානාත්මක අපරාධ කල්ලිවල සහ ප්‍රතිවාදීන්ගේ සාමාජිකත්වය ඇතුළුව සිරකරුවන් ඵලදායී ලෙස වෙන් කර ඇති බව සහතික කිරීම.

4. 1956 දෙපාර්තමේන්තු ස්ථාවර නියෝගවල 15 වන වගන්තියට අනුව, අයුතු සැලකිලි, පහරදීම් හෝ වෙනත් අක්‍රමිකතා සම්බන්ධයෙන් කඩිනම් පියවර ගැනීම සඳහා බලය සහ සීමා කිරීමේ උපකරණය භාවිතා කිරීම පිළිබඳ නීතිමය සීමාවන් පිළිබඳව බන්ධනාගාර නිලධාරීන් හා බන්ධනාගාර අධිකාරි දැනුවත් කිරීම.

5. ප්‍රචණ්ඩත්වය හේතුවෙන් මරණයක් සිදුවුවහොත් වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීම සඳහා මියගිය අයගේ වාට්ටු මාරු කිරීමේ වාර්තා පවත්වා ගැනීම.

2026 ජූලි 6 වන දින, HRCSL හි නිලධාරීන් කණ්ඩායමක් මීගමුව බන්ධනාගාරයට ගොස් තත්ත්වය නිරීක්ෂණය කිරීමට උත්සාහ කළ නමුත් බරපතල ආරක්ෂක ගැටළු හේතුවෙන් එම ස්ථානයට ඇතුළු වීමට නොහැකි විය. 2026 ජූලි 7 වන දින, HRCSL තුවාල ලැබූ රැඳවියන් කිහිප දෙනෙකු රඳවා තබා ඇති ජාතික රෝහලට ගොස්, රෝගී රැඳවියන්ගේ සුභසාධනය පිළිබඳව විමසීම් කළේය. විමර්ශන අධ්‍යක්ෂවරයා සමඟ දුරකථන සංවාද කිහිපයකදී HRCSL වෙත ඔබෙන් සෘජු යාවත්කාලීන කිරීම් ද ලැබුණි. එසේම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශන අංශය සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස්වරයෙකු. මෙම දුරකථන සංවාද අතරතුර තුවාල ලැබූ රැඳවියන්ගේ සහ බන්ධනාගාර නිලධාරීන්ගේ සුභසාධනය පිළිබඳව සාකච්ඡා කරන ලද අතර, ඔබ වාර්තා කළේ අනෙකුත් රැඳවියන්ගෙන් වෙන් කර ඔවුන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා සිරකරුවන් ටික දෙනෙකු අඟුණකොළපැලැස්ස, බූස්ස, යාපනය, දුම්බර, මඩකලපුව සහ වැලිකඩ යන බන්ධනාගාරවල පිහිටි අනෙකුත් බන්ධනාගාර වෙත මාරු කර ඇති බවයි. 2026 ජූලි 7 වන දින සවස් කාලයේ දී, ඉහත සඳහන් ස්ථානවලට මාරු කර යවන ලද රැඳවියන් කිහිප දෙනෙකු වධහිංසා පැමිණවීම සහ වෙනත් ආකාරයේ අයහපත් සැලකිලිවලට ලක්ව ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාවට තොරතුරු ලැබුණි. වැලිකඩ බන්ධනාගාර නිලධාරීන්ගේ භාරයේ සිටියදී සිරකරුවෙකු මිය යාම පිළිබඳ තොරතුරක් ද එහිදී ලැබුණු අතර, රාත්‍රී 8.30 ට පමණ, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්ෂණික ප්‍රතිචාර ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් වැලිකඩ බන්ධනාගාරයට පැමිණ රැඳවියන්ගේ සුභසාධනය පිළිබඳව විමසා සිටින ලදී. එහිදී වැලිකඩ බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර්වරයා ඉහත සඳහන් කණ්ඩායමට බන්ධනාගාරයට ඇතුළුවීම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව කොමිෂන් සභාව දැඩි කනස්සල්ලට පත්ව සිටී. එහිදී බන්ධනාගාර නිලධාරීන් ප්‍රකාශ කර ඇත්තේ, එය රාත්‍රී කාලය බැවින්, කණ්ඩායමට ප්‍රවේශ වීමට අවසර දීමට නොහැකි වූ බවය.

1996 අංක 21 දරණ HRCSL පනතේ 11(d) වගන්තිය යටතේ HRCSL වෙත 'අධිකරණ නියෝගයක් මගින් හෝ වෙනත් ආකාරයකින්, ඔවුන්ගේ රැඳවුම් ස්ථාන පරීක්ෂා කිරීමටත් රඳවා තබා ඇති පුද්ගලයින්ගේ සුභසාධනය නිරීක්ෂණය කිරීමට සහ ඔවුන්ගේ රැඳවුම් කොන්දේසි වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිර්දේශ ඉදිරිපත් කිරීමට' බලය පවරා ඇති බව සිහිපත් කර දීමට කැමැත්තෙමු. තවද, පනතේ 28(2) වගන්තිය මඟින් කොමිෂන් සභාව විසින් බලය පවරන ලද නිලධාරීන්ට:

**(ඕනෑම අවස්ථාවක, ඕනෑම රැඳවුම් ස්ථානයකට, පොලිස් ස්ථානයකට, බන්ධනාගාරයකට හෝ අධිකරණ නියෝගයක් මගින් හෝ වෙනත් ආකාරයකින් යම් තැනැත්තෙකු රඳවා තබා ඇති ස්ථානයකට ඇතුළු වී එහි සිටින පුද්ගලයින්ගේ රඳවා තබා ගැනීමේ තත්ත්වය තහවුරු කර ගැනීමට අවශ්‍ය විය හැකි ඕනෑම පරීක්ෂණයක් ඒ ස්ථානයෙහි කළ හැකිය. නැතහොත් එහි සිටින යම් තැනැත්තෙකුගෙන් විමසීම් කළ හැකිය.)**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ බලතල සහ කාර්යයන් මගින් එයට 'ඕනෑම අවස්ථාවක' බන්ධනාගාරයකට හෝ රැඳවුම් ස්ථානයකට ඇතුළු වීමට අවසර ලබා දී ඇත.

ඒ අනුව, ඕනෑම සිරකරුවෙකු රඳවා තබා ගැනීමේ කොන්දේසි තහවුරු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ඕනෑම වේලාවක වැලිකඩ බන්ධනාගාරයට ඇතුළු වීමට ව්‍යවස්ථාපිතව බලය පවරා ඇත.

ඉහත තත්වයන් යටතේ, ඔබ විසින් සම්පූර්ණයෙන් සහ ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කළ යුතු පහත සඳහන් නියමයන් නිකුත් කිරීමට කටයුතු කිරීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

1. ඕනෑම අවස්ථාවක එවැනි රැඳවියන් පරීක්ෂා කිරීමට පැමිණෙන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට බාධාවකින් තොරව ප්‍රවේශය ලබා දීම සඳහා කටයුතු කළ යුතු බවට සියලුම බන්ධනාගාර අධිකාරිවරුන් සහ ප්‍රධාන ජේලර්වරුන් ඇතුළු සියලුම බන්ධනාගාර නිලධාරීන්ට ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුයි.

2. මීගමුව බන්ධනාගාරයෙන් මෑතකදී මාරු කරන ලද සිරකරුවන් ඇතුළුව, ඔවුන්ගේ භාරයේ සිටින ඕනෑම සිරකරුවෙකුට එරෙහිව වධහිංසා පැමිණවීම හෝ වෙනත් ආකාරයේ අයහපත් සැලකිලි ඇතුළුව ඕනෑම පළිගැනීමේ ආදී ක්‍රියාවකින් වැළකී සිටින ලෙස සියලුම බන්ධනාගාර නිලධාරීන්ට ලිඛිත උපදෙස් නිකුත් කිරීම.

3. මීගමුව, අඟුණකොළපැලැස්ස, බූස්ස, යාපනය, දුම්බර, මඩකලපුව සහ වැලිකඩ බන්ධනාගාරවල රැඳවියන් කෙරෙහි කටයුතු කරන ආකාරය සම්බන්ධයෙන් සියලු සාක්ෂි සංරක්ෂණය කිරීමට සහ එවැනි සාක්ෂි විනාශ කිරීමෙන් හෝ විකෘති කිරීමෙන් වැළකී සිටීමට සියලුම බන්ධනාගාර නිලධාරීන්ට ලිඛිත උපදෙස් නිකුත් කිරීම.

4. අඟුණකොළපැලැස්ස, බූස්ස, යාපනය, දුම්බර, මඩකලපුව සහ වැලිකඩ බන්ධනාගාරවල රැඳවියන් වධහිංසා පැමිණවීම හෝ වෙනත් ආකාරයේ අයහපත් සැලකිලිවලට ලක් කිරීම සම්බන්ධයෙන් බන්ධනාගාර නිලධාරීන් විසින් පූර්ණ හා අපක්ෂපාතී පරීක්ෂණයක් පැවැත්වීම, එවැනි ක්‍රියාවන්හි නිරත වූ බවට හෝ එවැනි ක්‍රියාවන් වැළැක්වීමට අපොහොසත් වූ බවට සොයා ගන්නා ලද ඕනෑම නිලධාරියෙකුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම සහ එවැනි විමර්ශනය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් HRCSL වෙත ලබා දීම.

5. මීගමුව බන්ධනාගාරයේ ප්‍රචණ්ඩත්වය සහ ඉන් පසුව අනෙකුත් බන්ධනාගාර වල ඇති වූ සිදුවීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වත්මන් විමර්ශනයට පූර්ණ සහයෝගය ලබා දීම.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය,
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත් :

1. අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක, - කාරු. දැ.ගැ.පි.
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

2. ගරු. හර්ෂණ නානායක්කාර, - කාරු. දැ.ගැ.පි.
අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍ය,
අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය,
19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 01.

3. ගරු විජිත හේරත්, - කාරු. දැ.ගැ.පි.
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය,
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ 01.